## මහනුවර බහුවිධ ප්‍රවාහන පර්යන්ත සංවර්ධන ව්‍යාපෘතිය - 2022

---

මහනුවර බහුවිධ ප්‍රවාහන පර්යන්ත සංවර්ධන ව්‍යාපෘතියේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2021 අප්‍රේල් 22 දින එළඹි අංක 6623-එල්කේ (සහනදායී ණය) සහ අංක 6624-එල්කේ (සහනදායී නොවන ණය) දරන ණය ගිවිසුම්වල IV ව්‍යවස්ථාවේ 4.03 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළයුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

ණය ගිවිසුම අනුව, නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වේ. කෙසේ වෙතත්, 2021 වර්ෂයේදී මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ වගකීම අමාත්‍ය මණ්ඩල තීරණයක් මත ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය වෙත පවරා තිබුණු අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය බවට පත් විය. මහනුවර බහුවිධ ප්‍රවාහන පර්යන්තයේ පොදු ප්‍රවාහන භාවිතා කරන්නන් සඳහා ප්‍රවේශ්‍යතාව, කාර්යක්ෂමතාව සහ ආරක්ෂාව වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණු වේ. මහනුවර බහුවිධ ප්‍රවාහන පර්යන්තය සංවර්ධනය කිරීම, මහනුවර බහුවිධ ප්‍රවාහන පර්යන්තය අවට නගර ඒකාබද්ධ කිරීම සහ මාර්ග ආරක්ෂාව වැඩිදියුණු කිරීම, ආයතනික ශක්තිමත් කිරීම සහ ධාරිතා ගොඩනැගීම සහ හදිසි ප්‍රතිචාර සංරචකය යන සංරචක 04 යටතේ ව්‍යාපෘතියේ කාර්යයන් ක්‍රියාත්මක වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 13,762 කට සමාන වූ එ.ජ.ඩො. මිලියන 69.33 වන අතර ඉන් වි.හැ.හි. මිලියන 47.13 කට සමාන වූ එ.ජ.ඩො. මිලියන 64.33 ක් සහනදායී කොන්දේසි යටතේ ජාත්‍යන්තර සංවර්ධන සංගමය විසින් මූල්‍යනය කරනු ලබන අතර එ.ජ.ඩො. මිලියන 5 ක් සහනදායී නොවන කොන්දේසි යටතේ ජාත්‍යන්තර සංවර්ධන සංගමය විසින් මූල්‍යනය කරනු ලැබේ. ව්‍යාපෘතියේ කටයුතු 2021 මැයි 06 දින ආරම්භ කරන ලද අතර, 2025 මැයි 31 දින වනවිට නිම කිරීමට සැලසුම් කර තිබුණි.

**1.3 මතය**

2022 දෙසැම්බර් 31 දිනට මහනුවර බහුවිධ ප්‍රවාහන පර්යන්ත සංවර්ධන ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එහි මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5** මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

**1.6** මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුනු පිලිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.1 නීති, රීති සහ රෙගුලාසි වලට අනුකූල නොවීම**

| අංකය | නීති, රීති සහ රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම/විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | 2019 මාර්තු 15 දිනැති අංක. 01/2019 දරන කළමනාකරණ චක්‍රලේඛයේ 9.3 උප වගන්තිය | සමාලෝචිත වර්ෂය තුළ මෙහෙයුම් කමිටු රැස්වීම පවත්වා නොතිබුණි. | ව්‍යාපෘතියේ සිවිල් වැඩ ආරම්භ නොකිරීම හේතුවෙන් ව්‍යාපෘති මෙහෙයුම් කමිටු රැස්වීම් පවත්වා නොමැත. | කළමනාකරණ චක්‍රලේඛ උපදෙස් පිළිපැදිය යුතුය. |
| (ආ) | 2022 පෙබරවාරි 07 දිනැති අංක. 01/2022 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය | ව්‍යාපෘතියේ කාර්යයන් අභ්‍යන්තර විගණනය මගින් විගණනය කර නොතිබුණි. | සුදුසු නිලධාරියෙකු බඳවා ගැනීමට කටයුතු කරනු ඇත. | කළමනාකරණ විගණන චක්‍රලේඛ උපදෙස් වලට අනුකූල විය යුතුය. |
| (ඇ) | ණය ගිවිසුම | | | |
| | උපලේඛන 02 හි 01 වගන්තිය | (i) ණය ගිවිසුම අනුව ගිවිසුම ක්‍රියාත්මක වන දින සිට මාස දොළහක් ඇතුළත අධීක්ෂණ උපදේශකයකු පත් කර නොතිබුණි. | උපදේශක සහ කොන්ත්‍රාත් සේවාවන් ප්‍රදානය කළ පසු ව්‍යාපෘති මෙහෙයුම් අත්පොත සම්පූර්ණ කෙරේ. | ණය ගිවිසුමට අනුකූල වීම අවශ්‍ය වේ. |
| | | (ii) ණය ගිවිසුමට අනුව ණය ක්‍රියාත්මක වන දින සිට මාස හයකට පෙර ව්‍යාපෘති මෙහෙයුම් අත්පොතක් සකස් කර නොතිබුණි. | ව්‍යාපෘති මෙහෙයුම් අත්පොත සම්පූර්ණ කෙරනු ලැබේ. | ණය ගිවිසුමට අනුකූල වීම අවශ්‍ය වේ. |

**3.** භෞතික කාර්ය සාධනය

**3.1** කොන්ත්‍රාත් පරිපාලනය

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
| --- | --- | --- | --- |
| (අ) | ව්‍යාපෘති ණය 2021 මැයි 06 සිට ආරම්භ කර තිබුණද, සිවිල් සහ උපදේශක වැඩ ප්‍රසම්පාදන ක්‍රියාවලිය ප්‍රමාද වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසන් වන තුරුම ව්‍යාපෘතියේ සිවිල් වැඩ ආරම්භ කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, සමාලෝචිත වර්ෂය තුළ ව්‍යාපෘතිය විසින් දැරීමට අපේක්ෂිත එ.ජ.ඩො. මිලියන 18.61 කින්, රු. මිලියන 165.61 ට සමාන එ.ජ.ඩො. මිලියන 0.46 ක් වැය කර තිබුණි. | අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව ව්‍යාපෘතිය 2022 ජනවාරි මස සිට නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයෙන් ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයට මාරුකෙරුණු අතර ප්‍රසම්පාදන සැලැස්මට අනුව ප්‍රසම්පාදන කටයුතු සිදු වෙමින් පවතී. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය කඩිනම් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ඉදිකිරීම් කටයුතු මාස 36 කට වඩා ප්‍රමාද වීම හේතුවෙන් 2021 වසර අවසන් වන විට පුද්ගලයන් 825 දෙනෙකුට රු. මිලියන 712 ක් ව්‍යාපාර අලාභ සඳහා වන්දි වශයෙන් ගෙවා තිබුණු අතර එම පුද්ගලයින් 825 දෙනාගෙන් පුද්ගලයන් 17 දෙනෙකුට සමාලෝචිත වර්ෂය තුළ වන්දි වශයෙන් රු. මිලියන 8.40 ක මුදලක් නැවත ගෙවීමට සිදුව තිබුණි. තවද, ව්‍යාපෘතිය මගින් එම පුද්ගලයින් 17 දෙනා සඳහා 2023 සහ 2024 වසර සඳහා පිළිවෙළින් රු. මිලියන 11.49 ක් සහ රු. මිලියන 11.69 ක් වන්දි වශයෙන් ගෙවිය යුතුව පැවතුණි. ව්‍යාපෘතියේ මූලික සැලැස්මට අනුව ඉදිකිරීම් නිම කළ හැකි වූයේ නම් රු. මිලියන 31.59 ක අමතර වන්දියක් ඉතිරි කර ගත හැකිව තිබුණු බව නිරීක්ෂණය විය. | ව්‍යාපෘතිය 2022 ජනවාරි මස සිට නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයෙන් ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයට මාරුකෙරුණු අතර ප්‍රසම්පාදන සැලැස්මට අනුව ප්‍රසම්පාදන කටයුතු සිදු වෙමින් පවතී. | ඉඩම් වන්දි ක්‍රියාවලිය කඩිනම් කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.2 ඌන උපයෝජිත වත්කම්

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී ව්‍යාපෘතිය සඳහා රජයේ අරමුදල්වල ශුද්ධ ප්‍රතිපාදන රු. මිලියන 150 ක් වූ අතර සමාලෝචිත වර්ෂය තුළ ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 17.09 ක මුදලක් පමණක් උපයෝජනය කර තිබුණු බව නිරීක්ෂණය විය. දුම්රිය කාර්ය මණ්ඩලය සඳහාවූ ගොඩනැගිල්ල ඉදිකිරීමේ ප්‍රමාදය සහ ඉඩම් වන්දි ගෙවීම අවම තත්ත්වයක පැවතීම එම තත්ත්වයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි. තවද සමාලෝචිත වර්ෂය තුළ දුම්රිය දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයට නිවාස කුලී සඳහා රු. මිලියන 0.96 ක මුදලක් ගෙවා තිබුණි. | දුම්රිය ගොඩනැගිල්ල සඳහා පිරිවැය ඇස්තමේන්තු සකස් කිරීම වෙනුවෙන් උපදේශන කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට අදාල ප්‍රසම්පාදන කමිටුවෙන් අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමට ගත වූ කාලය හේතුවෙන් ප්‍රමාදයක් ඇති විය. | රජයේ දායක අරමුදල් ඵලදායී ලෙස භාවිතා කළ යුතුය. |
| (ආ) | ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුදල් නිදහස් කිරීමේ කාලසටහනට අනුව, සමාලෝචිත වර්ෂය අවසානයේදී එ.ජ.ඩො. මිලියන 13.5 ක් වැය කිරීමට අපේක්ෂා කර තිබුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය තුළ එ.ජ.ඩො. 460,000 ක් පමණක් නිදහස් කර තිබුණු අතර එයින් එ.ජ.ඩො. 406,640 ක් සමාලෝචිත වර්ෂය අවසානය වනවිට භාවිතා කර නොතිබුණි. එබැවින් සමාලෝචිත වර්ෂය තුළ අපේක්ෂිත සිවිල් සහ උපදේශක කටයුතු ක්‍රියාත්මක කර නොතිබූ බව නිරීක්ෂණය වූ අතර කැපකරු ගාස්තු, සේවා ගාස්තු සහ උපදේශක ගෙවීම් සිදු කර නොතිබීම ණය මුදල් ඌන උපයෝජනයට බලපා තිබුණි. | ප්‍රසම්පාදන කාලසටහනට අනුව මහනුවර බහුවිධ ප්‍රවාහන පර්යන්ත සංවර්ධන ව්‍යාපෘතියේ ඉදිකිරීම් කාලය අතරතුර බස් ධාවනය සඳහා උපදේශක සේවා කොන්ත්‍රාත්තුව මධ්‍යම පළාත් ප්‍රවාහන සේවා අධිකාරියට ප්‍රදානය කිරීමට අපේක්ෂා කර තිබුණි. ඒ අනුව අනුමැතිය සඳහා අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව ඉදිරිපත් කළ අතර තීරණය ප්‍රමාද විය. | ණය මුදල් ඵලදායී ලෙස භාවිතා කළ යුතුය. |